## කුට්ටම් පොකුණ



# දොරේ අප්පාගේ සිට ප්‍රනාන්දුපුල්ලේ දක්වා...





කොටි සංවිධානය මැරුව මුල්ම දෙමළ නායකයා වන්නේ ඇල්ප්‍රඩ් දොරේඅප්පා. ඔහු එකල යාපනේ පුරපති වගේම රටේ ආණ්ඩුවට සහයෝගය දක්වපු පුද්ගලයෙක්. අවසාන නොවන මේ ඝාතන රැල්ලේ මෑතක බිල්ල වුනේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිවරයා. නමුත් එය කොටින්ගේ අවසාන බිල්ල නෙවෙයි. කොටි සංවිධානය විසින් ජෙයරාජ්ව මැරුවේ ඇයි කියල පුරසාරම් ගොඩක් දොඩලා තිබ්බා. ඔවුන් හේතු වශයෙන් දක්වලා තිබ්බේ ආණ්ඩුව, ජෙයරාජ් ලව්ව මඩු දේවමෑණියන්ගේ රුවක ආකෘතියක් පාප් වහන්සේට පිලිගන්වන්න යනවා අණ්ඩුව ජෙයරාජ් ලවා උතුරු නැගෙනහිර විශාල ක්‍රිස්තියානි බලවේගයක් ගොඩනගාගෙන දෙමළ ක්‍රිස්තියානිකාරයන්ගෙ හිත දිනාගන්න යනවා, වගේ දේවල් මෙන්ම ආණ්ඩුවේ මීළඟ අගමැතිවරයා වන්නේ ජෙයරාජ් බවත්, දෙමළ ජාතිකයෙකු අගමැතිවීම තුලින් කොටි සංවිධානයේ ක්‍රියාවන්ට ලෝක ප්‍රජාව හමුවේ බලවත් පහරක් එල්ලවන බවත් එය වැලැක්වීමට ඔහු ඝාතනය කල බවත්ය. මේවා පිළිගත හැක්කේ කාටද? මේ කිසිම දෙයක් සිදුවන්නටත් කලින් ඔවුන් කිහිපවරක්ම ජෙයරාජ්ව මරා දමන්න උත්සහ කළා. ඔවුන් මුලින්ම උත්සහ කලේ මිනිස් බෝම්බයක් නැතිව ලෙහෙසියෙන්ම ජෙයරාජ්ව ඝාතනය කරන්න. ඒකත් බැරිම තැන තමයි මිනිස් බෝම්බය එව්වේ. කොපමණ හේතු ඉදිරිපත් කළත් මිනී මරන්න කොටි සංවිධානයට හේතු අවශ්‍ය නැහැ. ඔවුන්ට ඕනා එකට එක කිරීම සහ පළි ගැනීම. ඔවුන් ද.මු. දසනායක මරා දැම්මේත් උන්ගේ ඒවායේ හිලව්වට. සාමාන්‍ය අයට ක්ලේමෝ බෝම්බ සේම ළංවන්නට බැරි ප්‍රභූවරුන්ට මිනිස් බෝම්බද ඇති පදම් ඇති කොටි සංවිධානයේ බිලි ගැනීම හමුවේ සාමාන්‍ය ජනතාව මෙන්ම ආණ්ඩුවද පරාජයට පත්වෙලා. දෙමළාට දෙමළා විශ්වාස කරන්නට නොහැකි වූ විට ඔවුන්ව මරා දමා විශ්වාසය කරා ලැබිය යුතුයැයි යන මතයේ ගැලී සිටින කොටි සංවිධානය හැම අවස්ථාවේම මුලින්ම ඝාතනය කරන්නේ තමන්ගේම ද්‍රවිඩ සගයන් හා දේශපාලඥයන්ය. සිංහලයාගේද ඒ මතය තිබුනත්, ඔවුන් තවමත් කොටි තරම් ඝාතනය කරා යොමු වී නැහැ. භීෂණ සමයේ කීර්ති විජයබාහු නමින් තිබූ දේශප්‍රේමී සංවිධානයක් තමන්ගේම සිංහල ජාතිකයන් ඝාතනය කලත් මෑථකදී සිදුවූ පාවාදීම හමුවේ දේශප්‍රේමීන්ට ඒ බව අමතකව ගොස් තිබුණ එක රටේ වාසනාවක්. "හැම තිස්සෙම රට පාවාදෙන්නෙ අපේම එවුන් එන්.ඕ.ජී කාරයන්ට කත් ඇදලා කොටින්ව බේරාගන්නේ අපේ එවුන් යුද්ධය වවාගෙන කමින් සල්ලි යටි මඩි ගන්නේ අපේ එවුන් " යන්න හැමතිස්සෙම දකුණෙ සිංහලයන්ගේ කටින් පිටවුනත් මුන් ටික නැති වුනාම තමයි මේ ප්‍රශ්නෙ විසඳන්න පුළුවන් කියා ඔවුන් හිත හදාගෙන, වර්තමානයේ සිංහලයා සහ දෙමළා දෙදෙනාම මේ ප්‍රශ්නය දකින්නෙ එකම විදියට නිසා පතුලට කිඳා බැහැල යථාර්තය සොයාගෙන ප්‍රශ්නෙට පිළියම් හොයනවට වඩා අඳුරේ අතපත ගාන එක තමයි දෙගොල්ලොම කරන්නේ. ඒක මිනිස්සු උපදිනවා කවදාහරි මැරෙනවා කියලා මරලා වැඩක් නැහැ කියලා සාමාන්‍ය සිංහල ජනතාවට හිත හදාගන්න පුළුවන් වුනාට බහුතරයක් දෙමළ ජනතාවට ඒක බැරි වෙලා තියෙනවා. හින්දු ආගමත්, බුද්ධාගමත් දෙකම උපන්නේ ඉන්දියාවෙන්. බොහෝ සිංහල දෙමළ අය අදහන්නේ ඒ ආගම් දෙක. ඒ ආගම් දෙකෙන්ම සංහිඳියාව හා අවිහිංසාව හොඳින් අවබෝධ කරලා දීලා තියෙනවා. නමුත් ඒ කිසිම දේකින් අපි දෙගොල්ලොම කිසිම ප්‍රයෝජනයක් අරගෙන නැහැ. ප්‍රයෝජනයක් ගන්න හිතන්නෙත් නැහැ. ඒ අතින් ඉන්දියාව අපිට වැඩිය හුඟාක් ඉදිරියෙන්. හින්දු ආගම, බුද්ධාගමෙන් යථාර්තයට ලංවෙච්ච ආගමක් නොවුනත් ඒ ආගම අදහන ඉන්දියානුවෝ අද ලෝකයත් සමග ඉදිරියට යන්න සූදානම් වෙලා. ආගම්වලින්, භාෂාවලින් පිරිච්ච ඉන්දියාවට එහෙම පුළුවන්නම්, ඇයි අපිට බැරි කියලා. ලංකාවේ එකම ජාතිකයෙක්වත් නොහිතන එකක

***මේ සියල්ලටම සලකා බැලූ කල අප තවමත් එල් ටී ටීය ගැන සිතිය යුත්තේ වානරින්ද්‍ර ජාතකයේ ඉන්න කිඹුලා ලෙසය. මේ ප්‍රශ්නයට ඉදිරිපත්වන සෑම නායකයකුටම වඳුරා මෙන් සෝදිසි ඥානය, ධෛර්ය, කලබල නොවීමේ ගතිය තිබිය යුතුය. මන්ද කිඹුලා කිඹුලාමය. මේ ජාතක කථාවෙන් අපිට ලැබෙන වැදගත්ම පණිවිඩය වන්නේ හිතාමතා සොයා බලා ඥානවන්තව කටයුතු කරන පුද්ගලයා අන්‍ය බාධාවන් ජයගන්නා බවයි. එහෙයින් අපේ නායකයන්ට මෙන්ම අනෙක් නායකයන්ටද එම ප්‍රඥාව තිබිය යුතුය.***

අපේ රටේ කරුමයක්.

මෑතකදි රජීව් ගාන්ධි මහතාගේ දියණිය ප්‍රියංකා ගිහිල්ලා තිබුණා, ඇගේ පියාගේ ඝාතන නඩුවේ ප්‍රධාන සැකකාරියක් වන නිලිනි හම්බවෙන්න. නිලිනි සමඟ ප්‍රියංකාගේ ඇති වූ කතාබහ මාධ්‍යවලට සම්පූර්ණයෙන්ම වඩා සොයාගන්න බැරිවුණාත්, සමහර දේවල් ඔවුන් කෙසේ හෝ සොයාගත්ත. නලිනි පිළි අරන් තිබ්බ ගාන්ධිව මැරුවෙ ඔහු බවත් තමා එයට හවුල් වූ බවත්, නමුත් ප්‍රියංකට ඕන වෙලා තිබ්බ ඒක නෙවෙයි. අපට ඕන වෙලා තිබ්බේ කවුද ඒකට අනුබල දුන්නෙ කියලා දැනගන්න. ප්‍රියංකා දන්නවා ඒකට අනුබල දුන්නේ ප්‍රභකෙරන්ලා, පොට්ටුඅම්මාන්ලා බව. ඒත් මෙසේ හම්බුවෙන්න ගියේ වෙනත් දෙයක් දැනගන්න යන්න කුකුස කාතුලත් ඇතිවෙලා තියෙනවා. නමුත් ඇයට ඒක නාලිනිගෙන් දැනගන්න බැරිවුනා. රාජිව් ගාන්ධි ඝාතනයට ඉන්දියාව ඇතුලේම ලොකු දේශපාලඥයෙකුගේ සහයෝගය ලැබුනු බවට ඇති සැකය තවමත් පහව ගිහිල්ලා නැහැ සමහර විට. පියංකා යන්න ඇත්තේ ඒක හොයාගන්න. අන්තිමේදී ඇය අඬමින් අහලා තිබුනා "ඇයි මෙච්චර මිනිස්සුන්ට උදව් කරපු, රත්තරං හදවතක් තිබුනු අපේ තාත්තව මැරුවෙ" කියලා මෙතැනදි අපිට පැහැදිලි වෙන්න ප්‍රියංකට අවබෝධ කරගන්න බැරිවුනාට. කොච්චර උදව් කලත් කොටි සංවිධානය තමාට වචනයෙන් හෝ විරුද්ධ වෙන ඕනෑම කෙනෙක් මරන බව. අනෙක් පහල කොටි සාමාජිකත්වට කොච්චර බංකොලොත් වුනත් ඉහල නායකත්වය තවමත් ආරක්ෂා කරන බව. එහෙත් මෙතැන්දි ප්‍රියංකා හමුවිය යුත්තේ පහලපෙලේ නිලිනි වගේ අය නෙවෙයි ඒ කියන්නේ ප්‍රභාකරන් හරි, පොට්ටු අම්මාන් හරි මුණගැහිලා ඔය ටික කියලා ඇඬුවනම් කොච්චර අගේද? එහෙමනම් මේ ප්‍රශ්න විසඳගන්න ප්‍රියංකව සාම දූතියන් කරගන්නත් තිබ්බා. නෝර්වේත් කියලා තිබුණ ඉන්දියාව මැදිහත් වෙයි මේ ප්‍රශ්නෙට විසඳුමක් ලබාදිය යුත්තේ කියලා. ලංකාවේ හෙළ උරුමය, ජ.වි.පිය පිළිගත්තත් නැතත්, ලෝකයේ ඉන්න සාම පොරවල් මේ ප්‍රශ්නය ගැන හිතන්නෙ එහෙමයි. ඒක ඇත්ත, ඉන්දියාව අමතක කරලා මේක ගැන හිතන්නවත් බැරි විදියට තමයි ප්‍රශ්න සංකීර්න වෙලා තියෙන්නෙ. මේක යුද්ධෙන් කරන්න ලේසි නැති බව යුද්දෙ දිහා බලන් ඉන්න අපිට හොඳට පේනවා. වෙනම රටකට නොගියට, දෙමළ මිනිස්සුන්ට දෙන්න අපිට දෙයක් තියෙනවා කියලා ලෝකෙ අද පිළි අරගෙන ඉවරයි. ඒ නිසා ආණ්ඩුව කවුරු මැරුවත් කොටි සංවිධානයට අවාසියක් වෙන්නේ නැහැ. අන්තිමට අපිට ලැබෙන්නේ "ශෝක ප්‍රකාශ" හා "හෙළා දැකීම" දෙක විතරයි.

කොටින්ට මුලින්ම උදව් කරපු ප්‍රියංකාගෙ අත්තම්මා ඒ කියන්නේ ඉන්දිරා ගාන්ධි හා ඊට පස්සේ උදව්කරපු තාත්තගෙ ඉතිහාසය හා කොටි සම්බන්ධතාවය හොඳින් අධ්‍යනය කරලා ප්‍රියංකා මේ ප්‍රශ්නෙට බැහැල අපිට උදව් කරන්න පුළුවන්නම් කොච්චර අගේද එතකොට තමයි ඔය වැටෙන කඳුළු වල ප්‍රයෝජනය දැනගන්නෙ. අද අපේ රටේ දේශපාලඥයන්ට නම් කිසිම විසඳුමක් නැති බව පෙනෙ සියල්ලොම බිඳිලා විසිරිලා ඉන්න හැටි දැක්කම ජාතික බලවේග විකල්ප විසඳුම් ගැන කථා කරපු ජේ.වි.පි.ය අද ප්‍රාථමික තත්වයට පත්වෙලා. ඔවුන් කාර් එහාට මෙහාට ඇදගෙන මඩනාගන්නවා. මම මීට පෙර කිව්වා වගේ සමාජවාදයක් ගැන කතාකරපු ජේ.වි.පි.ය කොටස් කවදාහරි යූ ඇන් පී යත් එක්ක එකතුවෙලා හවුල් ආණ්ඩුවක් පිහිටුවනවා. මේ යන විදියට ඒක සිද්ධවෙන්න පුළුවන්.

බණ්ඩාරනායක, සේනානායක, ජයවර්ධන පරම්පරාවෙන් ඔවුන්ලේ දූ පුතුන්ට උරුමවෙච්ච මේ ප්‍රශ්නය ගැන මිනිස්සු බලාගෙන හිටියෙ ඔවුන්ගෙන්වත් විසඳුමක් කියලා. චන්ද්‍රිකාලා මහින්දලා ගැන මිනිස්සු ලොකු බලාපොරොත්තු තියගෙන හිටිය. අද ඒ බලාපොරොත්තු සී සී කඩ ඉන්දියාව පැත්තෙන් බැලුවත් එහෙමයි. ඉන්දිරාගෙන්, රාජීව් ගාන්ධිට උරුම වෙච්ච මේ දෙමළ සිංහල අර්බුදය ගැන විසඳුම් සුළඟේ පාවෙලා යද්දී, ඉන්දියාව පැත්තෙන් දැන අපිට බලාපොරොත්තු තියාගන්න පුළුවන්. ප්‍රියංකා වගේ කෙනෙකුගෙන් තමයිසමහරවිට අනාගතේ ප්‍රියංකා ඉන්දියාවෙ නායිකාව වෙන්නත් පුළුවන්.

ප්‍රියංකාවැනි කෙනෙකුගෙන් අපිට ලබාගන්න අනාගතේ හුඟක් දේවල් තිබෙයි. එහෙත් ඇය මේ ප්‍රශ්නය දිහා බැලිය යුත්තේ තම ආච්චි හෝ තාත්තා මෙන් නොවේ. වෙනස් ලෙසය. අද ඒ පරම්පරාවට මේක උරුමවෙලා.

මේ සියල්ලටම සලකා බැලූ කල අප තවමත් එල් ටී ටීය ගැන සිතිය යුත්තේ වානරින්ද්‍ර ජාතකයේ ඉන්න කිඹුලා ලෙසය. මේ ප්‍රශ්නයට ඉදිරිපත්වන සෑම නායිකාවකටම වඳුරා මෙන් සෝදිසි ඥානය, ධෛර්ය, කලබල නොවීමේ ගතිය තිබිය යුතුය. මන්ද කිඹුලා කිඹුලාමය. මේ ජාතක කථාවෙන් අපිට ලැබෙන වැදගත්ම පණිවිඩය වන්නේ හිතාමතාම සොයබලා ඥානවන්තව කටයුතු කරන පුද්ගලයා අන්‍ය බාධාවන් ජයගන්නා බවයි. එහෙයින් අපේ නායකයන්ට මෙන්ම අනෙක් නායකයන්ටද එම ප්‍රඥාව තිබිය යුතුය.

**ලක්ෂ්මන් කොඩිතුවක්කු විසිනි**